# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 2,391 - 2024 ජූනි මස 28 වැනි සිකුරාදා - 2024.06.28

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

## IV (අ) වැනි කොටස - පළාත් සභා

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිටුව |
|---|---|
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය ... ... | — |
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... ... | — |
| වෙනත් පත්කිරීම් ... ... ... ... | — |
| පළාත් සභා නිවේදන ... ... ... ... | — |
| අතුරු ව්‍යවස්ථා ... ... ... ... | — |

| | පිටුව |
|---|---|
| තනතුරු ඇබෑර්තු ... ... ... ... | — |
| විභාග විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | 558 |
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම් ... ... ... ... | — |
| තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... ... | — |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මීත් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2024 ජූලි මස 19 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2024 ජූලි මස 05 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර) තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2024 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www.documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

557 - B 082585 — 5, 403 (2024/06)
F 1 -

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

## වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව

### වයඹ පළාතේ පළාත් සභා පාසල්වල පවතින ශ්‍රී ලංකා ගුරු සේවයේ 3 පන්තියේ I (අ) ශ්‍රේණියේ පුරප්පාඩු සඳහා දිස්ත්‍රික් පදනම මත උපාධිධාරීන් බඳවා ගැනීම සඳහාවන විවෘත තරග විභාගය - 2024

වයඹ පළාතේ පළාත් සභා පාසල්වල ශ්‍රී ලංකා ගුරු සේවයේ 3 පන්තියේ I (අ) ශ්‍රේණියේ පවතින පුරප්පාඩුවලට දිස්ත්‍රික් පදනම මත ගුරුවරුන් බඳවා ගැනීම සඳහා වයඹ පළාත් සභා රාජ්‍ය සේවයේ ශ්‍රී ලංකා ගුරු සේවා ව්‍යවස්ථා සංග්‍රහය සහ මෙම නිවේදනය ප්‍රකාරව සුදුසුකම් සපුරා ඇති උපාධිධාරීන් වෙතින් මාර්ගගතව (Online) අයදුම්පත් කැඳවනු ලැබේ.

01. සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍ය විෂයයන් සඳහා මෙම බඳවා ගැනීම සිදු කරනු ලබන අතර එක් අයදුම්කරුවෙකු හට උපලේඛනයේ සඳහන් විෂයයන් අතුරින් උපරිම විෂයයන් 03 ක් ඉල්ලුම් කළ හැක. ප්‍රාථමික විෂයය හැර වෙනත් විෂයයන් ඉල්ලුම් කර ඇති අයදුම්කරුවෙකු එකී විෂයයන්වලට පත්වීමක් ලබාදීමට තෝරාගෙන නොමැති අවස්ථාවක දී ප්‍රාථමික විෂයය සඳහා සුදුසුකම් ලබා ඇත්නම් අයදුම්කරුගේ කැමැත්ත පරිදි ඊට අදාළව පත්වීමක් ලබාදීම සඳහා ද සළකා බලනු ලැබේ.

02. I. කුරුණෑගල දිස්ත්‍රික්කයේ පදිංචිකරුවන් කුරුණෑගල දිස්ත්‍රික්කයේ පාසල්වල පවතින විෂයය පුරප්පාඩු සඳහා ද, පුත්තලම දිස්ත්‍රික්කයේ පදිංචිකරුවන් පුත්තලම දිස්ත්‍රික්කයේ පාසල්වල පවතින විෂය පුරප්පාඩු සඳහා ද ඉල්ලුම් කිරීම කළ යුතු ය.

II. එසේ බඳවා ගැනීමේ දී අදාළ දිස්ත්‍රික්කයේ පදිංචිකරුවන්හට ප්‍රමුඛතාවය ලබා දෙනු ලැබේ.

III. එක් දිස්ත්‍රික්කයක පුරප්පාඩු සම්පූර්ණ කිරීම සඳහා සුදුසුකම් ලැබූවන් ප්‍රමාණවත් නොවන අවස්ථාවල දී පමණක් අනෙක් දිස්ත්‍රික්කයේ එකී විෂයන් සඳහා සුදුසුකම් ලැබූවන්ගෙන් පුරප්පාඩු පිරවීම සිදු කරනු ලැබේ.

03. එක් එක් දිස්ත්‍රික්කයේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා මාධ්‍යවලින් පුරප්පාඩු පවතින විෂයයන් විෂය උපලේඛනයේ දක්වා ඇති අතර පුරප්පාඩු සංඛ්‍යාව වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලැබේ.

04. *වැටුප් ක්‍රමය :*

මෙම තනතුරට 2022.01.05 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016 (IV) හි අංක ජී.ඊ. 1-2016-ඒ වැටුප් ඛණ්ඩයේ රු. 31,490 - 6x445 - 7x525 - 2x600 - රු. 39,035/- මාසික ඒකාබද්ධ වැටුප් පරිමාණය හිමිවන අතර, මෙම වැටුප් පරිමාණයේ 14 වන පියවර වන රු. 37,835/- වැටුප් පියවරේ තබා වැටුප් ගෙවනු ලැබේ.

05. *අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් :*

5.1 අධ්‍යාපන සුදුසුකම් :

I. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක් මගින් හෝ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් උපාධි පිරිනැමීමේ ආයතනයක් මගින් හෝ ප්‍රදානය කරනු ලැබූ, ඉගැන්වීම් කාර්යයන් සඳහා පිළිගත් සුවිශේෂී කරන ලද ක්ෂේත්‍රවලට අයත්, උපලේඛනයෙහි සඳහන් කර ඇති විෂයයන්ට අදාළව උපාධියක් හෝ (රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 46/90 අනුව) ශ්‍රී ලංකා කාර්මික විද්‍යාලය හෝ ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපනායතනය මගින් ලබා දෙන උසස් ජාතික සිව් අවුරුදු ගණකාධිකරණ ඩිප්ලෝමාව (HNDA) ලබා තිබීම.

*සහ*

II. අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේ දී සිංහල භාෂාව හෝ දෙමළ භාෂාව සමග ගණිතය ද විෂයයක් වශයෙන් සමත් වී තිබීම.

***ඉතා වැදගත්*** : මාර්ගගතව අයදුම් කිරීමේ දී සැලකිල්ලට ගත යුතු කරුණු.

- අයදුම්පත් භාරගන්නා අවසන් දින වන විට සියලු සුදුසුකම් සපුරා තිබිය යුතුය.
- ස්වකීය උපාධිය අනුව ඉල්ලුම් කළ හැකි විෂයන් පිළිබඳව අයදුම්කරුවන් සැළකිලිමත් විය යුතුය.

- උපාධියට හදාරා ඇති ප්‍රධාන විෂය හෝ විෂයයන් පිළිබඳ අවධානය යොමුකර විෂයය පුරප්පාඩු සඳහා ඉල්ලුම් කළ යුතුය. සිව් අවුරුදු උපාධියක් ලබා ඇත්නම් පළමුවන අවුරුදු 03හිම ප්‍රධාන විෂයයක් ලෙස අදාළ විෂයය හදාරා තිබීම ප්‍රමාණවත් වේ.

- එක් ජාතික හැඳුනුම්පත් අංකයක් යටතේ ඉදිරිපත් කළ හැක්කේ එක් මාර්ගගත අයදුම්පතක් පමණි. එබැවින් අයදුම් කිරීමට පෙර, ඇතුළත් කර ඇති තොරතුරු නිවැරදි දැයි පරීක්ෂා කිරීම සිදු කළ යුතුය. මාර්ගගත අයදුම්පතේ PDF ගොනුව බාගත කරගෙන එහි මුද්‍රිත පිටපත ලබාගත යුතුය.

5.2 කායික සහ මානසික යෝග්‍යතාවය ඃ

සෑම අපේක්ෂකයෙකුම ගුරුවරයෙකු වශයෙන් සිය රාජකාරි ඉටු කිරීමට සරිලන මානසික සහ ශාරීරික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

5.3 වයස ඃ

අයදුම්පත් කැඳවනු ලබන අවසන් දිනට වයස අවුරුදු 18 ට නොඅඩු හා අවුරුදු 40 ට නොවැඩි විය යුතුය.

5.4 වෙනත් සුදුසුකම් ඃ

I. අයදුම්කරු ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතු අතර වයඹ පළාත තුළ ස්ථිර පදිංචිය ලබා තිබිය යුතුය.

II. අයදුම්කරු විශිෂ්ට චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍යයෙන් යුක්ත විය යුතුය.

III. වයඹ පළාතේ ඕනෑම ප්‍රදේශයක සේවය කළ හැකි විය යුතුය.

IV. අයදුම්කරු අයදුම්පත් භාරගන්නා අවසාන දිනය වන විට වයඹ පළාතේ පූර්වාසන්න වසර 03 ක කාලයක්වත් ස්ථිරව පදිංචිව සිටි අයෙකු බවට ග්‍රාම නිලධාරී විසින් නිකුත් කරන ලද පදිංචි සහතිකයක් (DS 04 ග්‍රාම නිලධාරී සහතිකය) මගින් සම්මුඛ පරීක්ෂණ අවස්ථාවේ දී පදිංචිය සනාථ කළ යුතුය. අයදුම්පත් භාරගන්නා අවසාන දිනය වන විට **වයඹ පළාතේ ස්ථිර පදිංචිය පූර්වාසන්න වසර 03 කට වඩා අඩු අයදුම්කරුවන් ද තමන්** පදිංචි කාල සීමාව DS 04 ග්‍රාම නිලධාරී සහතිකයක් මගින් තහවුරු කළ යුතුය.

V. අයදුම්කරුහට අයදුම්පත් භාරගන්නා අවසාන දිනය වන විට වයඹ පළාතේ ස්ථිර පදිංචිය පූර්වාසන්න වසර 03 කට වඩා අඩුවන අවස්ථාවල දී, අයදුම්කරුගේ කලත්‍රයා හට වයඹ පළාතේ අවම වසර 03 ක කාලයක්වත් ස්ථිර පදිංචිය තිබේ නම්, එම අයදුම්කරුවන් පිළිබඳව ද ඉහත IV වගන්තිය ප්‍රකාරව සළකා බැලේ. කලත්‍රයාගේ පදිංචි සහතිකය (DS 04 ග්‍රාම නිලධාරී සහතිකය) හා විවාහ සහතිකය සම්මුඛ පරීක්ෂණ අවස්ථාවේ දී ඉදිරිපත් කළ යුතුය.

06. *සේවා කොන්දේසි ඃ*

I. රාජ්‍ය/පළාත් සහා රාජ්‍ය සේවා පත්වීම් පාලනය කෙරෙන පොදු කොන්දේසිවලට ද, වයඹ පළාත් සභා රාජ්‍ය සේවයේ ශ්‍රී ලංකා ගුරු සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ පනවා ඇති කොන්දේසිවලට ද, එම ව්‍යවස්ථාවට කර ඇති හා මින් මතුවට කෙරෙන සංශෝධනවලට ද යටත්ව තෝරාගනු ලබන උපාධිධාරී අපේක්ෂකයින් ශ්‍රී ලංකා ගුරු සේවයේ 3 පන්තියේ I (අ) ශ්‍රේණියට පත් කරනු ලැබේ.

II. මෙම තනතුර ස්ථිරය. මෙම තනතුරට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳව රජය විසින් ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයන්ට පත්වීම්ලාභීන් යටත් විය යුතුය.

III. මෙම තනතුරට පත් කරනු ලබන්නන් අවුරුදු 03 ක පරිවාස කාලයකට යටත් වේ.

IV. වයඹ පළාත් සභා රාජ්‍ය සේවයේ ශ්‍රී ලංකා ගුරු සේවා ව්‍යවස්ථා සංග්‍රහයට අනුව උසස්වීම් සිදු කරනු ලැබේ.

V. 2020.10.16 දිනැති රා.ප.ච.18/2020 අනුව සේවයට පත්වී වසර 03ක් ඇතුළත තනතුරට නියම කර ඇති දෙවෙනි රාජ්‍ය භාෂාව පිළිබඳ ප්‍රවීණතාවය ලබා ගත යුතුය.

VI. පත්වීම්ලාභීන් මුල් පත්වීම ලබන පාසල අයත් අධ්‍යාපන කලාපයේ අවම වශයෙන් වසර 06 ක් අනිවාර්යයෙන් සේවය කළ යුතු අතර එම වසර 06 ක කාලය තුළ ස්ථානමාරු සඳහා ඉල්ලීම් කළ නොහැක.

VII. තම මුල් පත්වීම ලබන පාසල අතිදුෂ්කර/දුෂ්කර පාසලක් නොවන කල්හි තම සේවා කාලය තුළ ඕනෑම අවස්ථාවක දී අවම වශයෙන් වසර 05 ක කාලයක් අතිදුෂ්කර/දුෂ්කර පාසලක සේවය කිරීමටද පත්වීම්ලාභීන් බැඳී සිටී.

07. *බඳවා ගැනීම :*

7.1 බඳවා ගැනීමේ ක්‍රමය :

වයඹ පළාත් සහා රාජ්‍ය සේවයේ ශ්‍රී ලංකා ගුරු සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ විධිවිධාන හා වයඹ පළාත් ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය අනුව බඳවාගැනීම් සිදු කරනු ලැබේ.

7.2 ලිඛිත තරග විභාගය : මෙම විභාගය ප්‍රශ්න පත්‍ර දෙකකින් සමන්විත වේ.

| *විෂය අංකය* | *විෂයය* | *උපරිම ලකුණු* | *සමත් වීමට අවශ්‍ය ලකුණු ප්‍රමාණය* |
|---|---|---|---|
| 01 | අභියෝග්‍යතා පරීක්ෂණය (කාලය පැය 01 යි) | 100 | 40 |
| 02 | සාමාන්‍ය දැනීම (කාලය පැය 01 යි) | 100 | 40 |

විෂයය නිර්දේශය :

විෂයය අංක 01 - අභියෝග්‍යතා පරීක්ෂණය

අපේක්ෂකයා සතු කුසලතා, තර්කානුකූල බුද්ධිය පිළිබඳ දැනුම මැන බැලීම අරමුණු කොට ගෙන මෙම ප්‍රශ්න පත්‍රය සකසනු ලැබේ. මෙය බහුවරණ හා කෙටි පිළිතුරු මාදිලියේ ප්‍රශ්න 50 කින් සමන්විතය. (එක් ප්‍රශ්නයකට ලකුණු 02 බැගින් මුළු ලකුණු 100 කි.)

විෂයය අංක 02 - සාමාන්‍ය දැනීම

සමාජ, ආර්ථික, දේශපාලනික ක්ෂේත්‍ර පිළිබඳව වූ සාමාන්‍ය දැනුම පරීක්ෂා කෙරෙන බහුවරණ ප්‍රශ්න 50 කින් සමන්විත වේ. (එක් ප්‍රශ්නයකට ලකුණු 02 බැගින් මුළු ලකුණු 100 කි.)

7.3 විභාග පටිපාටිය :

I. මෙම විභාගය සඳහා සිංහල, දෙමළ හෝ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ඉල්ලුම් කළ හැක.

II. සෑම අපේක්ෂකයෙකු ම ප්‍රශ්න පත්‍ර දෙකටම (02) පෙනී සිටිය යුතු ය.

III. සෑම අපේක්ෂකයෙකු ම මෙම විභාගයේ සියලුම ප්‍රශ්න පත්‍රවලට පෙනී සිටිය යුත්තේ එක් භාෂා මාධ්‍යයකිනි. එම භාෂා මාධ්‍යය සිය පත්වීම ලැබීමට අපේක්ෂිත භාෂා මාධ්‍යයම විය යුතුය.

IV. ඉංග්‍රීසි විෂය සඳහා ඉල්ලුම් කරන අයදුම්කරුවන් ඉංග්‍රීසි මාධ්‍යයෙන් අයදුම් කළ යුතුය.

V. අපේක්ෂකයෙකුට ස්වකීය අයදුම්පතේ දැක්වෙන භාෂා මාධ්‍යය පසුව වෙනස් කිරීමට අවසර දෙනු නොලැබේ.

7.4 සම්මුඛ පරීක්ෂණය හා ප්‍රායෝගික පරීක්ෂණය :

වයඹ පළාත් ගරු ආණ්ඩුකාරතුමන්ගේ අනුමැතිය පරිදි, ලිඛිත විභාගයේ දී ලබාගත් ලකුණුවල කුසලතා අනුපිළිවෙල අනුව එක් එක් විෂයයෙහි පවත්නා පුරප්පාඩු සංඛ්‍යාව මෙන් තුන් ගුණයක ප්‍රමාණයක් සම්මුඛ පරීක්ෂණය හා ප්‍රායෝගික පරීක්ෂණය සඳහා එකවර කැඳවනු ලැබේ. සම්මුඛ පරීක්ෂණයට ඉදිරිපත්වන සියලුම අයදුම්කරුවන් ප්‍රායෝගික පරීක්ෂණයට මුහුණ දීම අනිවාර්ය වේ.

I. සම්මුඛ පරීක්ෂණයේ දී කැඳවනු ලබන විෂයට/විෂයයන්ට අදාළව අයදුම්කරු විසින් මෙම *ගැසට්* නිවේදනයේ සඳහන් සුදුසුකම් සපුරා තිබේදැයි පරීක්ෂා කිරීම සිදු කරන අතර උපාධි පන්ති සාමාර්ථ හා අමතර සුදුසුකම් සඳහා ලකුණු ලබාදීම සිදු කෙරේ.

*(අ)* පන්ති සාමාර්ථය සඳහා ලකුණු ලබා දීම. (උපරිම ලකුණු 07)

පළමු පන්තිය - ලකුණු 07
දෙවන පන්තිය (ඉහළ) - ලකුණු 05
දෙවන පන්තිය (පහළ) - ලකුණු 03

*(ආ) අමතර සුදුසුකම් සඳහා ලකුණු ලබා දීම.* (උපරිම ලකුණු 10)

| *අනු. අංකය* | *නිර්ණායකය* | *උපරිම ලකුණු* |
|---|---|---|
| 01 | දහම් පාසල් අවසාන විභාග සහතිකය හෝ වෙනත් ආගම් සඳහා ඒ හා සමාන මට්ටමේ විභාගයක් සමත් වී ඇති බවට පිළිගත් සහතිකයක් ලබා තිබීම. | 05 |
| 02 | ක්‍රීඩා, සෞන්දර්ය ආදී විෂයය සමගාමී ක්‍රියාකාරකම් සඳහා රජයේ හෝ රජය පිළිගත් ජාතික මට්ටමේ ප්‍රථම, දෙවන, තෙවන ජයග්‍රහණ සඳහා සහතික එකක් හෝ කිහිපයක් ලබා තිබීම | 05 |

II. *ප්‍රායෝගික පරීක්ෂණය.* (උපරිම ලකුණු 08)

ප්‍රායෝගික පරීක්ෂණයේ දී අයදුම්කරු විසින් තමා අයදුම් කළ ඕනෑම විෂයකට අදාළ ව විනාඩි 5 කට නොඅඩු ඉදිරිපත් කිරීමක් කළ යුතුයි. ප්‍රායෝගික පරීක්ෂණය මගින් අයදුම්කරු සතු අදහස් ප්‍රකාශ කිරීමේ කුසලතාව සහ සන්නිවේදන කුසලතාව පරීක්ෂා කෙරේ.

08. *විභාග මධ්‍යස්ථාන :*

මෙම තරග විභාගය පහත දැක්වෙන නගරවල දී පවත්වනු ලැබේ. විභාග මධ්‍යස්ථානයක් පිහිටුවීමට ප්‍රමාණවත් අයදුම්කරුවන් පිරිසක් නොමැති නම් ආසන්න වෙනත් විභාග මධ්‍යස්ථානයක් වෙත ඔවුන් යොමු කරනු ඇත.

| *නගරය* | *අංකය* |
|---|---|
| කුරුණෑගල | 01 |
| කුලියාපිටිය | 02 |
| මහව | 03 |
| පුත්තලම | 04 |
| හලාවත | 05 |

09. තෝරා ගැනීමේ ක්‍රමය :

*(අ)* වයඹ පළාත් සභා රාජ්‍ය සේවයේ ගුරු සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ සඳහන් විධිවිධාන ප්‍රකාර ව තෝරා ගැනීම සිදු කරනු ලැබේ.

*(ආ)* කිසියම් අපේක්ෂකයෙකු ඉල්ලුම් කරන ලද විෂයන් අතරින් එක් විෂයකට වඩා වැඩි විෂයන් ගණනකට සුදුසුකම් ලබා ඇති අවස්ථාවක ඔහුට/ඇයට පත්වීම ලබාදෙන විෂය කුමක්ද යන්න වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලැබේ.

10. *විභාග ගාස්තු :*

විභාග ගාස්තු වශයෙන් රු. 1,200/- ක් වයඹ පළාත් සභාවේ අංක 2003-02-13 දරන ආදායම් ශීර්ෂයට බැර වන පරිදි වයඹ පළාතේ ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට මුදල් ගෙවා තමා නමින් ලබා ගත් ව.ප.ස.මු. 02 ලදුපත බාගත කරගත් අයදුම්පත්‍රයේ නියමිත ස්ථානයේ අලවා ඉදිරිපත් කළ යුතු ය. ව.ප.ස.මු. 02 ආකෘතියේ ලදුපත හැර වෙනත් ආයතනවලට මුදල් ගෙවා ලබාගත් ලදුපත් හා මුදල් ඇණවුම් හෝ මුදල් කිසිවක් භාරගනු නොලබන අතර එවැනි ලදුපත් ඉදිරිපත් කරන අයදුම්කරුවන්ට විභාගය සඳහා ඉදිරිපත් වීමට ඉඩ නොදෙන බව ද, කුමන හේතුවක් නිසා හෝ ගෙවූ විභාග ගාස්තු ආපසු නොගෙවන බව ද, එම විභාග ගාස්තු වෙනත් කවර හෝ විභාගයක් සඳහා මාරු කිරීමට ඉඩ දෙනු නොලබන බව ද සැලකිය යුතු ය. (මුදල් ගෙවූ ලදුපතේ ඡායාස්ථ පිටපතක් මතු ප්‍රයෝජනය සඳහා ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් විය හැක).

11. *අයදුම් කළ යුතු පිළිවෙල :*

11.1 *(අ)* මෙම බඳවාගැනීම සඳහා අයදුම්පත් කැඳවීම මාර්ගගත ක්‍රමය ඔස්සේ psc.nw.gov.lk දරන වෙබ් අඩවිය මගින් සිදු කරනු ලැබේ. psc.nw.gov.lk දරන වෙබ් අඩවියට පිවිස එහි දක්වා ඇති උපදෙස් අනුගමනය කර අයදුම් කිරීම කළ යුතුය. ඊට අමතරව, මාර්ගගතව සම්පූර්ණ කරන ලද අයදුම්පත PDF ගොනුවක් ලෙස බාගත කර එහි මුද්‍රිත පිටපතක් ද එවිය යුතුය.

*(ආ)* අයදුම් කරනු ලැබූ විෂයය/විෂයයන්/දිස්ත්‍රික්කය කිසිසේත් වෙනස් කරනු නොලැබේ.

*(ඇ)* බාගත කරන ලද මුද්‍රිත පිටපතෙහි, විභාග ගාස්තු ගෙවූ කුවිතාන්සිය අයදුම්පත්‍රයේ නියමිත ස්ථානයේ අලවා වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ලියාපදිංචි තැපෑලෙන් හෝ තැපැල් කුරියර් සේවාව ඔස්සේ ඉදිරිපත් කළ යුතු ය. (බාගත කරන ලද මුද්‍රිත පිටපතෙහි ඡායාස්ථ පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් විය හැක)

*(ඈ)* **අයදුම්පත් භාරගන්නා අවසන් දිනය 2024.08.01**

11.2 මාර්ගගත ක්‍රමය ඔස්සේ නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පතෙහි මුද්‍රිත පිටපත 2024.08.07 වැනි දිනට හෝ ඊට පෙර ලැබෙන සේ පහත ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් හෝ තැපැල් කුරියර් සේවාව මගින් එවිය යුතුය.

ලේකම්,
වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
පළාත් සභා කාර්යාල සංකීර්ණය,
කුරුණෑගල.

අයදුම්පත බහා ඇති කවරයේ වම් පස ඉහළ කෙලවරේ පැහැදිලිව "**වයඹ පළාත් සභා ගුරු සේවයට උපාධිධාරීන් බඳවාගැනීම 2024**" සහ පදිංචි දිස්ත්‍රික්කය සඳහන් කළ යුතුය.

***සැළකිය යුතුයි*** : ආබාධිත අයදුම්කරුවන් ස්වකීය අයදුම්පත්‍රයේ මුද්‍රිත පිටපතෙ හි වම්පස ඉහළ කෙළවර ඒ බව සඳහන් කර එවිය යුතුය.

12. *අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :*

බාගත කරන ලද අයදුම්පතෙ හි අපේක්ෂකයාගේ අත්සන රජයේ විද්‍යාලයක විදුහල්පතිවරයෙකු/සාමදාන විනිශ්වයකරුවකු / දිවුරුම් කොමසාරිස්වරයෙකු / නීතිඥවරයෙකු / ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු / ත්‍රිවිධ හමුදාවේ අධිකාරි බලයලත් නිලධාරියෙකු / පොලිස් සේවයේ *ගැසට්* කළ තනතුරක් දරන නිලධාරියෙකු හෝ රු. 41,580/= කට වැඩි ආරම්භක මූලික මාසික වැටුපක් ලබන රජයේ ස්ථිර තනතුරක් දරන රාජ්‍ය / පළාත් සභා රාජ්‍ය සේවයේ මාණ්ඩලික නිලධාරියෙකු හෝ විසින් සහතික කරනු ලැබ තිබිය යුතුය.

13. *අපේක්ෂකයන්ගේ අනන්‍යතාවය :*

අපේක්ෂකයින් විභාගයට පෙනී සිටින අවස්ථාවේ දී සෑම විෂයයක් සඳහා ම පහත සඳහන් ලියකියවිලිවලින් තම අනන්‍යතාවය තහවුරු කළ යුතුය.

*(අ)* පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත ;

*හෝ*

*(ආ)* වලංගු විදේශ ගමන් බලපත්‍රය/වලංගු රියදුරු බලපත්‍රය.

***සටහන*** : විභාග ශාලාවේ දී තම අනන්‍යතාවය තහවුරු කිරීමට අපේක්ෂකයෙකු අපොහොසත් වුවහොත් ඔහු/ඇය විභාග යට පෙනී සිටීම සඳහා නුසුදුස්සෙකු ලෙස සළකනු ලැබේ.

14. ඉල්ලුම් පත්‍රය සම්පූර්ණ කිරීමේ දී සැළකිලිමත් ව නිරවද්‍ය තොරතුරු සැපයිය යුතුය. එම තොරතුරු කිසිදු අයුරකින් සංශෝධනයට ඉඩදෙනු නොලැබේ. මෙම බඳවා ගැනීමේ නීතිරීති අනුව යම් අයදුම්කරුවකු විභාගයට, සම්මුඛ පරීක්ෂණයට සහ ප්‍රායෝගික පරීක්ෂණයට පෙනී සිටීමට නුසුදුසු බව අනාවරණය වුවහොත් ඕනෑම අවස්ථාවක දී ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කළ හැකිය. අයදුම්කරුවකු ගුරුවරයකු ලෙස තෝරා පත්කර ගැනීමෙන් පසුව සාවද්‍ය තොරතුරු ඉදිරිපත් කර ඇති බව හෝ නිරවද්‍ය තොරතුරු ඕනෑකමින් යටපත් කර ඇති බව හෝ අනාවරණය වුවහොත් ඕනෑම අවස්ථාවක සේවයෙන් පහ කිරීමට හෝ සේවය අවසන් කිරීමට කටයුතු කරනු ලැබේ.

15. මෙම නිවේදනයේ සඳහන් සුදුසුකම් සම්පූර්ණ ඇති අය පමණක් අයදුම්කර ඇතැයි යන පූර්ව නිගමනය මත අයදුම්පත් භාරගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර නියමිත පරිදි විභාග ගාස්තු ගෙවා ඊට අදාළ ලදුපත තොරතුරු සමඟ නිවැරදිව සම්පූර්ණ කරන ලද මාර්ගගත අයදුම්පත් හා මුද්‍රිත පිටපත ඉදිරිපත් කර ඇති අයදුම්කරුවන් වෙත වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් විසින් විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත. අයදුම්කරුවන් වෙත විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්යාලීය වෙබ් අඩවියේ (www.psc.nw.gov.lk) නිවේදනයක් පළකරනු ලැබේ. ලිඛිත විභාගය පැවැත්වෙන දිනට දින 03 කට පෙර ප්‍රවේශ පත්‍රය නොලැබිණි නම් ඒ බව වහාම වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ විභාග අංශයට දැනුම් දිය යුතුය.

***සැලකිය යුතුයි*** : සම්මුඛ පරීක්ෂණ හා ප්‍රායෝගික පරීක්ෂණ සඳහා සුදුසුකම් ලබන්නන්ගේ නාමලේඛන වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්යාලීය වෙබ් අඩවියේ පමණක් (www.psc.nw.gov.lk) පළ කරනු ලබන බැවින්, අයදුම්කරුවන් නිරන්තරයෙන් එම වෙබ් අඩවිය පරිශීලනය කිරීම කළ යුතු වේ.

16. අයදුම්පත් කැඳවීමේ නිවේදනයට අදාළ කරුණු හෝ එම නිවේදනයෙන් ආවරණය නොවන හෝ එම නිවේදනයේ විධිවිධාන සලසා නොමැති වෙනත් කිසියම් කරුණක් වෙතොත් ඒ සම්බන්ධයෙන් වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණය අවසාන තීරණය වේ.

17. මෙම විභාගය පැවැත්වීම, කල් දැමීම, අවලංගු කිරීම හෝ පැවැත්වීමෙන් පසු තෝරා ගැනීම / නොගැනීම හෝ පුරප්පාඩු සංඛ්‍යාව පිළිබඳ අවසාන තීරණය වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතුය.

18. සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් පළවන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් නොගැළපීමක් හෝ අනනුකූලතාවක් ඇති බව පෙනී යන්නේ නම් එවැනි අවස්ථාවක සිංහල මාධ්‍ය නිවේදනය නිවැරදි සේ සළකා කටයුතු කරනු ලැබේ.

වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

**ඊ. එම්. පී. ඒකනායක,**
ලේකම්,
වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව.

2024 ජූනි මස 15 වැනි දින දී ය.
පළාත් සභා කාර්යාල සංකීර්ණය,
කුරුණෑගල.

| අනු. අංකය | විෂයය | අධ්‍යාපන සුදුසුකම් | පුත්තලම දිස්ත්‍රික්කය | | | කුරුණෑගල දිස්ත්‍රික්කය | | |
|---|---|---|---|---|---|---|---|---|
| | | | සිංහල | දෙමළ | ඉංග්‍රීසි | සිංහල | දෙමළ | ඉංග්‍රීසි |
| | ප්‍රාථමික අංශය (1-5 ශ්‍රේණි) | | | | | | | |
| | | **සිංහල මාධ්‍යය** | | | | | | |
| 1 | ප්‍රාථමික | I. සම්පූර්ණ අධ්‍යයන කාලය තුළම සිංහල භාෂාව / සිංහල වාග් විද්‍යාව විෂයය ප්‍රධාන විෂයයක් ලෙස හදාරා ඇති ශාස්ත්‍රවේදී සාමාන්‍ය උපාධිය හෝ විශේෂ උපාධිය; *හෝ* II. ඕනෑම උපාධියක් සමඟ අ.පො.ස. (උසස් පෙළ) සිංහල විෂයය සඳහා සම්මාන සාමාර්ථයක් හෝ ඊට ඉහළ සාමාර්ථයක් ලබා තිබීම; *හෝ* III. ඕනෑම උපාධියක් සමඟ අ.පො.ස. (සා/පෙළ) විභාගයේ දී සිංහල විෂයය සඳහා විශිෂ්ට සාමාර්ථයක් සහ ගණිතය විෂයය සඳහා සම්මාන සාමාර්ථයක් හෝ ඊට ඉහළ සාමාර්ථයක් ලබා තිබීම; | ✓ | | | ✓ | | |
| | | **දෙමළ මාධ්‍යය** | | | | | | |
| | | I. සම්පූර්ණ අධ්‍යයන කාලය තුළම සිංහල භාෂාව / දෙමළ වාග් විද්‍යාව විෂයය ප්‍රධාන විෂයයක් ලෙස හදාරා ඇති ශාස්ත්‍රවේදී සාමාන්‍ය උපාධිය හෝ විශේෂ උපාධිය; *හෝ* II. ඕනෑම උපාධියක් සමඟ අ.පො.ස. (උසස් පෙළ) දෙමළ විෂයය සඳහා සම්මාන සාමාර්ථයක් හෝ ඊට ඉහළ සාමාර්ථයක් ලබා තිබීම; *හෝ* III. ඕනෑම උපාධියක් සමඟ අ.පො.ස. (සා/පෙළ) විභාගයේ දී දෙමළ විෂයය සඳහා විශිෂ්ට සාමාර්ථයක් සහ ගණිතය විෂයය සඳහා සම්මාන සාමාර්ථයක් හෝ ඊට ඉහළ සාමාර්ථයක් ලබා තිබීම. | | ✓ | | | ✓ | |
| | ද්විතීක අංශය 6-11 ශ්‍රේණි) | | | | | | | |

| අනු. අංකය | විෂයය | අධ්‍යාපන සුදුසුකම් | පුත්තලම දිස්ත්‍රික්කය | | | කුරුණෑගල දිස්ත්‍රික්කය | | |
|---|---|---|---|---|---|---|---|---|
| | | | සිංහල | දෙමළ | ඉංග්‍රීසි | සිංහල | දෙමළ | ඉංග්‍රීසි |
| 2 | විද්‍යාව | I. ජීව විද්‍යාව / රසායන විද්‍යාව / භෞතික විද්‍යාව විෂයය සහිත විද්‍යාවේදී / ව්‍යවහාරික විද්‍යාවේදී සාමාන්‍ය හෝ විශේෂ උපාධියක් සමග අ.පො.ස. (උසස් පෙළ) ජීව විද්‍යාව, රසායන විද්‍යාව හා භෞතික විද්‍යාව සමත් වී තිබීම;<br>*හෝ*<br>II. ඕනෑම විද්‍යාවේදී සාමාන්‍ය හෝ විශේෂ උපාධියක් සමග අ.පො.ස. (උසස් පෙළ) ජීව විද්‍යාව, රසායන විද්‍යාව හා භෞතික විද්‍යාව විෂයයන් සඳහා සම්මාන සාමාර්ථයක් හෝ ඊට ඉහළ සාමාර්ථයක් ලබා තිබීම. | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ |
| 3 | ගණිතය | I. ගණිතය විෂයය සහිත විද්‍යාවේදී / ව්‍යවහාරික විද්‍යාවේදී සාමාන්‍ය හෝ විශේෂ උපාධිය සමග අ.පො.ස. (උසස් පෙළ) සංයුක්ත ගණිතය / ගණිතය සමත් වී තිබීම.<br>*හෝ*<br>II. ඕනෑම සාමාන්‍ය හෝ විශේෂ උපාධියක් සමග අ.පො.ස. (උසස් පෙළ) සංයුක්ත ගණිතය/ගණිතය විෂයය සඳහා සම්මාන සාමාර්ථයක් හෝ ඊට ඉහළ සාමාර්ථයක් ලබා තිබීම. | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ |
| 4 | පළමු බස (සිංහල) සහ සාහිත්‍යය | සම්පූර්ණ අධ්‍යයන කාලය තුළ ම සිංහල/සිංහල වාග් විද්‍යාව ප්‍රධාන විෂයයක් ලෙස හදාරා ඇති ශාස්ත්‍රවේදී සාමාන්‍ය හෝ විශේෂ උපාධිය. | ✓ | | | ✓ | | |
| 5 | පළමු බස (දෙමළ) සහ සාහිත්‍යය | සම්පූර්ණ අධ්‍යයන කාලය තුළ ම දෙමළ / දෙමළ වාග් විද්‍යාව විද්‍යාව ප්‍රධාන විෂයයක් ලෙස හදාරා ඇති ශාස්ත්‍රවේදී සාමාන්‍ය හෝ විශේෂ උපාධිය. | | ✓ | | | ✓ | |
| 6 | ඉංග්‍රීසි | සම්පූර්ණ අධ්‍යයන කාලය තුළ ම ඉංග්‍රීසි භාෂාව / ඉංග්‍රීසි සාහිත්‍ය / ඉංග්‍රීසි වාග් විද්‍යාව ප්‍රධාන විෂයයක් ලෙස හදාරා ඇති සාමාන්‍ය උපාධිය හෝ විශේෂ උපාධිය. | | | ✓ | | | ✓ |
| 7 | ඉතිහාසය | සම්පූර්ණ අධ්‍යයන කාලය තුළ ම ඉතිහාසය / පුරාවිද්‍යාව විෂයය ප්‍රධාන විෂයයක් ලෙස හදාරා ඇති ශාස්ත්‍රවේදී සාමාන්‍ය උපාධිය හෝ විශේෂ උපාධිය. | ✓ | ✓ | | ✓ | ✓ | |
| 8 | බුද්ධ ධර්මය | බුද්ධ ධර්මය / බෞද්ධ ශිෂ්ටාචාරය / බෞද්ධ සංස්කෘතිය පිළිබඳ ශාස්ත්‍රවේදී සාමාන්‍ය හෝ විශේෂ උපාධිය. | ✓ | | | ✓ | | |
| 9 | හින්දු ආගම | හින්දු ශිෂ්ටාචාරය/හින්දු ආගම විෂය ප්‍රධාන විෂයක් ලෙස හදාරා ඇති ශාස්ත්‍රවේදී සාමාන්‍ය හෝ විශේෂ උපාධිය. | | ✓ | | | ✓ | |
| 10 | ඉස්ලාම් ධර්මය | ඉස්ලාම් දර්ශනය/ඉස්ලාම් ශිෂ්ටාචාරය / ඉස්ලාම් ආගම විෂය ප්‍රධාන විෂයක් ලෙස හදාරා ඇති ශාස්ත්‍රවේදී සාමාන්‍ය හෝ විශේෂ උපාධිය. | | ✓ | | | ✓ | |
| 11 | කතෝලික ධර්මය | දේව ධර්මය / ක්‍රිස්තියානි ශිෂ්ටාචාරය / ක්‍රිස්තියානි සංස්කෘතිය පිළිබඳ ශාස්ත්‍රවේදී සාමාන්‍ය හෝ විශේෂ උපාධිය. | ✓ | ✓ | | | | |
| 12 | ක්‍රිස්තියානි ධර්මය | ක්‍රිස්තියානි ධර්මය / ක්‍රිස්තියානි ශිෂ්ටාචාරය /ක්‍රිස්තියානි සංස්කෘතිය පිළිබඳ ශාස්ත්‍රවේදී සාමාන්‍ය හෝ විශේෂ උපාධිය. | ✓ | | | | | |

| අනු. අංකය | විෂයය | අධ්‍යාපන සුදුසුකම් | පුත්තලම දිස්ත්‍රික්කය | | | කුරුණෑගල දිස්ත්‍රික්කය | | |
|---|---|---|---|---|---|---|---|---|
| | | | සිංහල | දෙමළ | ඉංග්‍රීසි | සිංහල | දෙමළ | ඉංග්‍රීසි |
| 13 | භූගෝල විද්‍යාව | සම්පූර්ණ අධ්‍යයන කාලය තුළම භූගෝල විද්‍යාව ප්‍රධාන විෂයයක් ලෙස හදාරා ඇති ශාස්ත්‍රවේදී සාමාන්‍ය හෝ විශේෂ උපාධිය. | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ |
| 14 | පුරවැසි අධ්‍යාපනය | සමාජ විද්‍යාව/දේශපාලන විද්‍යාව/භූගෝල විද්‍යාව/ ජනසන්නිවේදනය/ සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය / ඉතිහාසය / ආර්ථික විද්‍යාව හෝ එම විෂය සංයෝජන සහිත ඕනෑම ශාස්ත්‍රවේදී සාමාන්‍ය හෝ විශේෂවේදී උපාධියක්. | ✓ | ✓ | | ✓ | ✓ | |
| 15 | ව්‍යාපාර හා ගිණුම්කරණය | ව්‍යාපාර හා ගිණුම්කරණ විෂයය සහිත කළමනාකරණවේදී/ගණකාධිකරණවේදී/ වාණිජවේදී/ විද්‍යාවේදී සාමාන්‍ය හෝ විශේෂ උපාධිය. | ✓ | ✓ | ✓ | ✓ | ✓ | |
| 16 | හින්දි භාෂාව | අදාළ විෂය ප්‍රධාන විෂයයක් ලෙස හදාරණු ලැබූ විදේශ භාෂා උපාධියක් හෝ අදාළ විෂයට විශේෂ උපාධියක් ලබා තිබීම. | | | | ✓ | | |
| 17 | ජපන් | | ✓ | | | ✓ | | |
| 18 | අරාබි | | | ✓ | | | ✓ | |
| 19 | ජර්මන් | | | | | ✓ | | |
| 20 | කොරියන් | | ✓ | | | ✓ | | |
| 21 | දෙවන භාෂාව (සිංහල) | සිංහල මාධ්‍ය ශාස්ත්‍රවේදී සාමාන්‍ය හෝ විශේෂ උපාධියක් සමග අ.පො.ස. (උ.පෙළ) සිංහල විෂය සමත් වීම. | | ✓ | | | ✓ | |
| 22 | දෙවන භාෂාව (දෙමළ) | දෙමළ මාධ්‍ය ශාස්ත්‍රවේදී සාමාන්‍ය හෝ විශේෂ උපාධියක් සමග අ.පො.ස. (උ.පෙළ) දෙමළ විෂය සමත්වීම. | ✓ | | | ✓ | | |
| 23 | පෙරදිග සංගීතය | I. සම්පූර්ණ අධ්‍යයන කාලය තුළ ම පෙරදිග සංගීතය ප්‍රධාන විෂයයක් ලෙස හදාරා ඇති ලලිත කලාවේදී/ප්‍රාසාංගික කලාවේදී සාමාන්‍ය උපාධිය හෝ විශේෂ උපාධිය.<br>හෝ<br>II. සම්පූර්ණ අධ්‍යයන කාලය තුළ ම පෙරදිග සංගීතය විෂයය සහිත ශාස්ත්‍රවේදී සාමාන්‍ය උපාධිය හෝ විශේෂ උපාධිය සමග අ.පො.ස. (උසස් පෙළ) සංගීතය විෂයයට සම්මාන සාමාර්ථයක් හෝ ඊට ඉහළ සාමාර්ථයක් ලබා තිබීම. | ✓ | | | ✓ | | |
| 24 | බටහිර සංගීතය | I. සම්පූර්ණ අධ්‍යයන කාලය තුළ ම බටහිර සංගීතය ප්‍රධාන විෂයයක් ලෙස හදාරා ඇති ලලිත කලාවේදී/ප්‍රාසාංගික කලාවේදී සාමාන්‍ය උපාධිය හෝ විශේෂ උපාධිය.<br>හෝ<br>II. සම්පූර්ණ අධ්‍යයන කාලය තුළ ම බටහිර සංගීතය විෂයය සහිත ශාස්ත්‍රවේදී සාමාන්‍ය උපාධිය හෝ විශේෂ උපාධිය සමග අ.පො.ස. (උසස් පෙළ) බටහිර සංගීතය විෂයයට සම්මාන සාමාර්ථයක් හෝ ඊට ඉහළ සාමාර්ථයක් ලබා තිබීම. | ✓ | | | | | |

| අනු. අංකය | විෂයය | අධ්‍යාපන සුදුසුකම් | පුත්තලම දිස්ත්‍රික්කය | | | කුරුණෑගල දිස්ත්‍රික්කය | | |
|---|---|---|---|---|---|---|---|---|
| | | | සිංහල | දෙමළ | ඉංග්‍රීසි | සිංහල | දෙමළ | ඉංග්‍රීසි |
| 25 | කර්ණාටක සංගීතය | I. සම්පූර්ණ අධ්‍යයන කාලය තුළ ම කර්නාටක සංගීතය ප්‍රධාන විෂයයක් ලෙස හදාරා ඇති ප්‍රාසාංගික කලාවේදී සාමාන්‍ය උපාධිය හෝ විශේෂ උපාධිය;<br>හෝ<br>II. සම්පූර්ණ අධ්‍යයන කාලය තුළ ම කර්නාටක සංගීතය විෂයය සහිත ශාස්ත්‍රවේදී සාමාන්‍ය උපාධිය හෝ විශේෂ උපාධිය සමග අ.පො.ස. (උසස් පෙළ) කර්නාටක සංගීතය විෂයයට සම්මාන සාමාර්ථයක් හෝ ඊට ඉහළ සාමාර්ථයක් ලබා තිබීම. | | ✓ | | | | |
| 26 | චිත්‍ර | I. සම්පූර්ණ අධ්‍යයන කාලය තුළ ම චිත්‍ර ප්‍රධාන විෂයයක් ලෙස හදාරා ඇති ලලිත කලාවේදී/ ප්‍රාසාංගික කලාවේදී/දෘශ්‍ය කලාවේදී සාමාන්‍ය උපාධිය හෝ විශේෂ උපාධිය.<br>හෝ<br>II. සම්පූර්ණ අධ්‍යයන කාලය තුළ ම චිත්‍ර විෂයය සහිත ශාස්ත්‍රවේදී සාමාන්‍ය උපාධිය හෝ විශේෂ උපාධිය සමග අ.පො.ස. (උසස් පෙළ) චිත්‍ර විෂයට සම්මාන සාමාර්ථයක් හෝ ඊට ඉහළ සාමාර්ථයක් ලබා තිබීම. | ✓ | ✓ | | ✓ | ✓ | |
| 27 | නර්තනය (පෙරදිග) | I. සම්පූර්ණ අධ්‍යයන කාලය තුළ ම පෙරදිග නර්තනය ප්‍රධාන විෂයයක් ලෙස හදාරා ඇති ලලිත කලාවේදී / ප්‍රාසාංගික කලාවේදී සාමාන්‍ය උපාධිය හෝ විශේෂ උපාධිය ;<br>හෝ<br>II. සම්පූර්ණ අධ්‍යයන කාලය තුළම පෙරදිග නර්තනය සහිත ශාස්ත්‍රවේදී සාමාන්‍ය උපාධිය හෝ විශේෂ උපාධිය සමග අ.පො.ස. (උසස් පෙළ) පෙරදිග නර්තනය විෂයයට සම්මාන සාමාර්ථයක් හෝ ඊට ඉහළ සාමාර්ථයක් ලබා තිබීම. | ✓ | | | ✓ | | |

| අනු. අංකය | විෂයය | අධ්‍යාපන සුදුසුකම් | පුත්තලම දිස්ත්‍රික්කය | | | කුරුණෑගල දිස්ත්‍රික්කය | | |
|---|---|---|---|---|---|---|---|---|
| | | | සිංහල | දෙමළ | ඉංග්‍රීසි | සිංහල | දෙමළ | ඉංග්‍රීසි |
| 28 | නර්තනය (භරත) | I. සම්පූර්ණ අධ්‍යයන කාලය තුළම භරත නර්තනය ප්‍රධාන විෂයයක් ලෙස හදාරා ඇති ලලිත කලාවේදී / ප්‍රාසාංගික කලාවේදී සාමාන්‍ය උපාධිය හෝ විශේෂ උපාධිය;<br>හෝ<br>II. සම්පූර්ණ අධ්‍යයන කාලය තුළ ම භරත නර්තනය සහිත ශාස්ත්‍රවේදී සාමාන්‍ය උපාධිය හෝ විශේෂ උපාධිය සමග අ.පො.ස. (උසස් පෙළ) භරත නර්තනය විෂයයට සම්මාන සාමාර්ථයක් හෝ ඊට ඉහළ සාමාර්ථයක් ලබා තිබීම. | | ✓ | | | | |
| 29 | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය | සම්පූර්ණ අධ්‍යයන කාලය තුළ ම තොරතුරු තාක්ෂණය / පරිගණක විද්‍යාව ප්‍රධාන විෂයයක් ලෙස හදාරා ඇති විද්‍යාවේදී/ කළමනාකරණ සහ තොරතුරු තාක්ෂණවේදී / ශාස්ත්‍රවේදී /තොරතුරු තාක්ෂණවේදී සාමාන්‍ය උපාධිය හෝ විශේෂ උපාධිය. | ✓ | ✓ | | ✓ | ✓ | |
| 30 | කෘෂි කර්මය හා ආහාර තාක්ෂණය | කෘෂි විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී සාමාන්‍ය හෝ විශේෂ උපාධිය හෝ කෘෂි හා ආහාර තාක්ෂණය ප්‍රධාන විෂයයක් ලෙස හදාරා ඇති විද්‍යාවේදී සාමාන්‍ය හෝ විශේෂ උපාධිය. | ✓ | ✓ | | ✓ | ✓ | |
| 31 | ගෘහ ආර්ථික විද්‍යාව | ඕනෑම සාමාන්‍ය හෝ විශේෂ උපාධියක් සමග අ.පො.ස. (උ/පෙළ) විභාගයේදී ගෘහ ආර්ථික විද්‍යාව විෂයයට සම්මාන සාමාර්ථයක් හෝ ඊට ඉහළ සාමාර්ථයක් ලබා තිබීම. | ✓ | ✓ | | ✓ | | |
| 32 | සෞඛ්‍යය හා ශාරීරික අධ්‍යාපනය | I. ක්‍රීඩා විද්‍යාව සහ කළමනාකරණය / ශාරීරික අධ්‍යාපනය පිළිබඳ සාමාන්‍ය උපාධිය හෝ විශේෂ උපාධිය; හෝ<br>II. ක්‍රීඩා හා විශ්‍රාන්ති කළමනාකරණය පිළිබඳ ශාස්ත්‍රවේදී සාමාන්‍ය උපාධිය හෝ විශේෂ උපාධිය. | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ |
| 33 | සන්නිවේදනය සහ මාධ්‍ය අධ්‍යයනය | ජනසන්නිවේදනය / සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය ප්‍රධාන විෂයක් ලෙස හදාරා ඇති ශාස්ත්‍රවේදී සාමාන්‍ය හෝ විශේෂ උපාධිය. | ✓ | | | ✓ | | |
| | **තෘතීක අංශය (12-13 ශ්‍රේණි)** | | | | | | | |
| 34 | රසායන විද්‍යාව | I. සිව් අවුරුදු විශේෂ උපාධියක දී විශේෂ විෂයය ලෙස හෝ වෙනත් ප්‍රධාන විෂයයක් ලෙස රසායන විද්‍යාව හදාරා ඇති විද්‍යාවේදී / ව්‍යවහාරික විද්‍යාවේදී උපාධිය;<br>හෝ<br>II. තුන් අවුරුදු උපාධියක දී මුළු විෂය සන්ධාරයෙන් 1/3 ක් ලෙස රසායන විද්‍යාව හදාරා ඇති විද්‍යාවේදී / ව්‍යවහාරික විද්‍යාවේදී උපාධිය. | ✓ | | | ✓ | | |

| අනු. අංකය | විෂයය | අධ්‍යාපන සුදුසුකම් | පුත්තලම දිස්ත්‍රික්කය | | | කුරුණෑගල දිස්ත්‍රික්කය | | |
|---|---|---|---|---|---|---|---|---|
| | | | සිංහල | දෙමළ | ඉංග්‍රීසි | සිංහල | දෙමළ | ඉංග්‍රීසි |
| 35 | භෞතික විද්‍යාව | (I) සිව් අවුරුදු විශේෂ උපාධියක දී විශේෂ විෂයය ලෙස හෝ වෙනත් ප්‍රධාන විෂයයක් ලෙස භෞතික විද්‍යාව හදාරා ඇති විද්‍යාවේදී / ව්‍යවහාරික විද්‍යාවේදී උපාධිය;<br>හෝ<br>(II) තුන් අවුරුදු උපාධියක දී මුළු විෂය සන්ධාරයෙන් 1/3 ක් ලෙස භෞතික විද්‍යාව හදාරා ඇති විද්‍යාවේදී / ව්‍යවහාරික විද්‍යාවේදී උපාධිය. | ✓ | ✓ | | ✓ | | |
| 36 | ජීව විද්‍යාව | (I) සිව් අවුරුදු විශේෂ උපාධියක දී විශේෂ විෂයය ලෙස උද්භිද විද්‍යාව / ශාක ජීව විද්‍යාව / සත්ත්ව විද්‍යාව හදාරා ඇති හා විශේෂ විෂයය උද්භිද විද්‍යාව /ශාක ජීව විද්‍යාව වනවිට අනෙක් ප්‍රධාන විෂයය ලෙස සත්ත්ව විද්‍යාව ද, විශේෂ විෂයය සත්ත්ව විද්‍යාව වනවිට අනෙක් ප්‍රධාන විෂයය ලෙස උද්භිද විද්‍යාව / ශාක ජීව විද්‍යාව ද අ.පො.ස (උසස් පෙළ) විෂයය නිර්දේශයට අනුකූලවන පරිදි හදාරා ඇති විද්‍යාවේදී / ව්‍යවහාරික විද්‍යාවේදී උපාධිය.<br>හෝ<br>(II) තුන් අවුරුදු සාමාන්‍ය උපාධියක දී උද්භිද විද්‍යාව / ශාක ජීව විද්‍යාව හා සත්ත්ව විද්‍යාව යන විෂයයන් දෙකෙහි ම එකතුව, මුළු විෂයය සන්ධාරයෙන් අවම වශයෙන් 1/3ක් බැගින් අ.පො.ස (උසස් පෙළ) විෂයය නිර්දේශයට අනුකූල වන පරිදි හදාරා ඇති විද්‍යාවේදී / ව්‍යවහාරික විද්‍යාවේදී උපාධිය. | ✓ | | | ✓ | | |
| 37 | කෘෂි විද්‍යාව | (1) විද්‍යාවේදී කෘෂි තාක්ෂණය හා කළමනාකරණ උපාධිය (B.Sc. Agricultural Technology and Management)/විද්‍යාවේදී කෘෂිකර්ම උපාධිය (B.Sc. Agriculture) / විද්‍යාවේ දී කෘෂි සම්පත් කළමනාකරණ හා තාක්ෂණ උපාධිය (B.Sc.Agricultural Resources Management and Technology) / විද්‍යාවේදී කෘෂි ව්‍යාපාර කළමනාකරණ උපාධිය (B.Sc. Agri Business Management) / විද්‍යාවේදී අපනයන කෘෂිකර්ම උපාධිය (B.Sc. Export Agriculture)<br>හෝ<br>(2) උසස් පෙළ කෘෂි විද්‍යාව විෂය නිර්දේශයට අනුකූල වන පරිදි මුළු විෂයය සන්ධාරයෙන් 1/3 ක් ආවරණයවන විෂයයන් අන්තර්ගත වන ඕනෑම විද්‍යාවේදී උපාධියක් හදාරා තිබීම. | ✓ | | | ✓ | | |

| අනු. අංකය | විෂයය | අධ්‍යාපන සුදුසුකම් | පුත්තලම දිස්ත්‍රික්කය | | | කුරුණෑගල දිස්ත්‍රික්කය | | |
|---|---|---|---|---|---|---|---|---|
| | | | සිංහල | දෙමළ | ඉංග්‍රීසි | සිංහල | දෙමළ | ඉංග්‍රීසි |
| 38 | සංයුක්ත ගණිතය | (1) සිව් අවුරුදු විශේෂ උපාධියක දී විශේෂ විෂය ලෙස උසස් ගණිතය හදාරා තිබීම හෝ විශේෂ විෂයය ව්‍යවහාරික ගණිතය වන විට අනෙක් ප්‍රධාන විෂයයක් ලෙස ශුද්ධ ගණිතය ද, විශේෂ විෂයය ශුද්ධ ගණිතය වන විට අනෙක් ප්‍රධාන විෂයයක් ලෙස ව්‍යවහාරික ගණිතය ද හදාරා ඇති විද්‍යාවේදී/ ව්‍යවහාරික විද්‍යාවේදී උපාධිය;<br>හෝ<br>(2) තුන් අවුරුදු සාමාන්‍ය උපාධියක දී ව්‍යවහාරික ගණිතය හා ශුද්ධ ගණිතය යන විෂයයන් දෙකෙහිම එකතුව මුළු විෂයය සන්ධාරයෙන් අවම වශයෙන් 1/3ක් බැගින් හදාරා ඇති විද්‍යාවේදී / ව්‍යවහාරික විද්‍යාවේදී උපාධිය. | ✓ | ✓ | | ✓ | ✓ | |
| 39 | ඉංජිනේරු තාක්ෂණය | උපාධියෙහි මුළු විෂයය සන්ධාරයෙන් 1/3ක් ඉදිකිරීම්, යාන්ත්‍රික, විදුලි හා/හෝ ඉලෙක්ට්‍රෝනික් යන විෂය ක්ෂේත්‍ර ආවරණය වන පරිදි හදාරා ඇති ඉංජිනේරු / තාක්ෂණවේදී / ඉංජිනේරු තාක්ෂණවේදී උපාධිය. | ✓ | | | ✓ | ✓ | |
| 40 | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය | (1) සිව් අවුරුදු විශේෂ උපාධියක දී තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය / පරිගණක විද්‍යාව විශේෂ විෂයය හෝ වෙනත් ප්‍රධාන විෂයක් ලෙස හෝ හදාරා ඇති උපාධිය;<br>හෝ<br>(2) තුන් අවුරුදු උපාධියක දී මුළු විෂයය සන්ධාරයෙන් අවම වශයෙන් 1/3ක් වන සේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය/ පරිගණක විද්‍යාව ප්‍රධාන විෂයයක් ලෙස හදාරා ඇති උපාධිය | ✓ | | | ✓ | ✓ | |
| 41 | ගිණුම්කරණය | සම්පූර්ණ අධ්‍යයන කාලය තුළම ගිණුම්කරණය විෂයය ප්‍රධාන විෂයයක් ලෙස හදාරා ඇති වාණිජවේදී / ව්‍යාපාර පරිපාලනවේදී / ව්‍යාපාර කළමනාකරණවේදී / විද්‍යාවේදී / ගිණුම්කරණවේදී විශේෂ උපාධිය. | ✓ | ✓ | | ✓ | ✓ | ✓ |
| 42 | ව්‍යාපාර අධ්‍යයනය | ව්‍යාපාර අධ්‍යයනය / ගිණුම්කරණය / වානිජ්‍ය යන විෂයයන්ගෙන් එක් විෂයයක් ඇතුළත් වාණිජවේදී/ ශාස්ත්‍රවේදී / ව්‍යාපාර පරිපාලනවේදී / විද්‍යාවේදී / ව්‍යාපාර කළමනාකරණවේදී විශේෂ උපාධිය. | ✓ | ✓ | ✓ | ✓ | | |
| 43 | තර්ක ශාස්ත්‍රය | තර්ක ශාස්ත්‍රය/දර්ශනය විෂයය ප්‍රධාන විෂයයක් ලෙස හදාරා ඇති ශාස්ත්‍රවේදී විශේෂ උපාධිය | ✓ | | | ✓ | | |
| 44 | ආර්ථික විද්‍යාව | ආර්ථික විද්‍යාව විශේෂ උපාධිය | ✓ | ✓ | | ✓ | ✓ | |
| 45 | භූගෝල විද්‍යාව | භූගෝල විද්‍යාව විශේෂ උපාධිය | ✓ | ✓ | | ✓ | ✓ | |

| අනු. අංකය | විෂයය | අධ්‍යාපන සුදුසුකම් | පුත්තලම දිස්ත්‍රික්කය | | | කුරුණෑගල දිස්ත්‍රික්කය | | |
|---|---|---|---|---|---|---|---|---|
| | | | සිංහල | දෙමළ | ඉංග්‍රීසි | සිංහල | දෙමළ | ඉංග්‍රීසි |
| 46 | දේශපාලන විද්‍යාව | දේශපාලන විද්‍යාව විශේෂ උපාධිය. | ✓ | ✓ | | ✓ | ✓ | |
| 47 | ගෘහ ආර්ථික විද්‍යාව | ඕනෑම සාමාන්‍ය හෝ විශේෂ උපාධියක් සමග අ.පො.ස. (උ/පෙළ) විභාගයේ දී ගෘහ ආර්ථික විද්‍යාව විෂයයට සම්මාන සාමාර්ථයක් හෝ ඊට ඉහළ සාමාර්ථයක් ලබා තිබීම. | ✓ | | | ✓ | | |
| 48 | සන්නිවේදනය සහ මාධ්‍ය අධ්‍යයනය | ජනසන්නිවේදනය / සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය ප්‍රධාන විෂයයක් ලෙස හදාරා ඇති ශාස්ත්‍රවේදී විශේෂ උපාධිය. | ✓ | | | ✓ | | |
| 49 | බෞද්ධ ශිෂ්ටාචාරය | බුද්ධ ධර්මය / බෞද්ධ ශිෂ්ටාචාරය / බෞද්ධ සංස්කෘතිය පිළිබඳ ශාස්ත්‍රවේදී විශේෂ උපාධිය. | ✓ | | | ✓ | | |
| 50 | චිත්‍ර කලාව | I. සම්පූර්ණ අධ්‍යයන කාලය තුළම චිත්‍ර ප්‍රධාන විෂයයක් ලෙස හදාරා ඇති ලලිත කලාවේදී/ ප්‍රාසාංගික කලාවේදී/දෘශ්‍ය කලාවේදී සාමාන්‍ය උපාධිය හෝ විශේෂ උපාධිය ;<br>හෝ<br>II. සම්පූර්ණ අධ්‍යයන කාලය තුළම චිත්‍ර විෂයය සහිත ශාස්ත්‍රවේදී සාමාන්‍ය උපාධිය හෝ විශේෂ උපාධිය සමග අ.පො.ස. (උසස් පෙළ) චිත්‍ර විෂයයට සම්මාන සාමාර්ථයක් හෝ ඊට ඉහළ සාමාර්ථයක් ලබා තිබීම. | ✓ | ✓ | | ✓ | ✓ | |
| 51 | සිංහල | සම්පූර්ණ අධ්‍යයන කාලය තුළම සිංහල/සිංහල වාග් විද්‍යාව ප්‍රධාන විෂයයක් ලෙස හදාරා ඇති ශාස්ත්‍රවේදී විශේෂ උපාධිය. | ✓ | | | ✓ | | |
| 52 | දෙමළ | සම්පූර්ණ අධ්‍යයන කාලය තුළම දෙමළ/දෙමළ වාග් විද්‍යාව ප්‍රධාන විෂයයක් ලෙස හදාරා ඇති ශාස්ත්‍රවේදී විශේෂ උපාධිය. | | ✓ | | | ✓ | |
| 53 | හින්දි භාෂාව | හින්දි භාෂාව පිළිබඳ විශේෂවේදී උපාධිය. | | ✓ | | | | |
| 54 | ශිෂ්‍ය උපදේශනය | සම්පූර්ණ අධ්‍යයන කාලය තුළම උපදේශනය හෝ මනෝවිද්‍යාව ප්‍රධාන විෂයයක් ලෙස හදාරා ඇති සාමාන්‍ය හෝ විශේෂ උපාධිය. | ✓ | ✓ | | ✓ | ✓ | |
| 55 | පුස්තකාල | පුස්තකාල හා විඥාපන විද්‍යාව පිළිබඳ උපාධිය. | ✓ | ✓ | | ✓ | ✓ | |

06-212